**ශීර්ෂය 297 - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

**-------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 297 - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ,2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 ජූනි 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 05 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023දෙසැම්බර් 31 දිනට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු 1.6.1 හි නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත දී තිබූ ණය මුදල පියවා ගැනීම වෙනුවෙන් භාණ්ඩාගාරයට බැර කළ යුතු ආදායමෙන් අර්ධයක් අඩුකර ගැනීමට ඉඩදී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී එසේ අඩුකරගත් රු.182,911,676 ක මුදල, මාසික ගිණුම් සාරාංශවල ආදායමෙන් ආපසු ගෙවීමක් ලෙස දක්වා තිබීම නිසා 20.03.02.10 දරන ආදායම් ශීර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. එමෙන්ම 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයෙහි 3.1 මාර්ගෝපදේශය ප්‍රකාරව CIGAS යෙදුම මගින් උත්පාදනය කරන ලද ශේෂ පිරික්සුම (Consolidated Trail Balance) කිසිදු වෙනස් කිරීමකින් තොරව භාවිතා කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත් අඩුකරගත් මුදල ආදායමට එකතු කර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර තිබුණි. | 2024 වර්ෂයේ සිට නිවැරදි කර ගිණුම් තැබීමට කටයුතු කරන බව. | ණය ආපසු ගෙවීම නිවැරදිව දැක්විය යුතුය. |
| (ආ) | 2016 වර්ෂයට පමණක් පැනවූ සමාගම් ලියාපදිංචි කිරීමේ අයබද්ද ක්‍රියාත්මක කරගෙන යාමේදී අයකළ ගාස්තුව සංශෝධනය කිරීම නිසා බද්ද මුලින් ගෙවූ සමාගම්වලින් වැඩිපුර අයවූ බද්ද ආපසු | නැවත ගෙවීම සඳහා භාණ්ඩාගාරය විසින් මුදල් නිකුත් කරනු ලැබූයේ අග්‍රිමයක් වශයෙන් බව සහ ACA 1 ආකෘතියෙහි | ආදායම් සහ වියදම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන තුල පෙන්නුම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| ගෙවීමට තීරණය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී රු.88,230,000 ක් ආපසු ගෙවා තිබුණු අතර එය 10.03.07.08 ආදායම් ශීර්ෂය යටතේ ආදායමින් ආපසු ගෙවීමක් ලෙස මාසික ගිණුම් සාරාංශවලින් වාර්තාගත කර ඇතත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි ආදායමින් ආපසු ගෙවීම් ලෙස සටහන් නොකර වෙනත් පුනරාවර්තන වියදමක් ලෙස දක්වා තිබුණි. | දෙපාර්තමේන්තුව විසින් රැස් කරන ලද ශුද්ධ ආදායම වාර්තා කිරීමට ඇති බැවින් මෙම මුදල ආදායමෙන් ආපසු ගෙවීමක් ලෙස දැක්වුව හොත් එමගින් ශුද්ධ ආදායම නිවැරදිව නිරූපණය නොවන බැවින් එය වෙනත් පුනරාවර්තන ආදායමක් ලෙස දක්වන ලද බව. මෙය 2024 වර්ෂයේ ගිණුම් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දී වාර්ෂික වාර්තා ගොනු නොකළ සමාගම්වලින් අයවිය යුතු හිඟ ආදායමින් රු.28,814,400 ක් එනම් සියයට 2.2 ක් රැස්කර ඇතත්, මූල්‍ය ප්‍රකාශනයේ ඒසීඒ 1 (i), හිඟ ආදායම් ප්‍රකාශනයෙහි ඒ පිළිබඳ සටහන් කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම රු.1,529,339,000 ක් වී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 128 (2) (ඉ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පෙර වර්ෂවලට අනුරූපීව හිඟ ආදායම් වාර්තාව සකස් කරන ලද බව සහ 2024 වර්ෂයේ ගිණුම්වල එය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් නිවැරදිව වාර්තා කිරීමට හා කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | 1891 අංක 16 දරන සමිති ආඥා පනතේ (123 වන අධිකාරිය) 8(1) (ඇ) වගන්තිය ප්‍රකාරව වාර්ෂික වාර්තා ගොනුකළ යුතු ලියාපදිංචි සමිති 11,940 කින් රු.13,731,000 ක ආදායමක් රැස්කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ආදායම් අය කර ගැනීම සඳහා ඉදිරියේදී පියවර ගනු ලබන බව. | පනත ප්‍රකාරව ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.2 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 1.1.7 වගන්තිය ප්‍රකාරව ස්ථාන මාරුවන නිලධාරීන්ගේ ණය ශේෂ ස්ථාන මාරු වී මාස 03 ක් ගතවීමෙන් පසු නිරවුල් නොවූ ණය ශේෂ ලෙස නොපෙන්වීමට වගබලා ගත යුතු වුවත්, වෙනත් දෙපාර්තමේන්තු වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරීන් තිදෙනෙකුට අදාළව රු.120,741 ක මුදලක් ස්ථාන මාරු වී වර්ෂ 23 ත් වර්ෂ 34 ත් අතර කාලයක් ගතවී ඇතත්, නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් සඳහා ඉදිරිපත් කර ඇති බව. | නොපියවූ ණය ශේෂ නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 184 ක් වුවද, තථ්‍ය කාර්ය මණ්ඩලය 136 ක් වූයෙන් පුරප්පාඩු 48 ක් විය. | තනතුරු පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වරින් වර ලිපි ඉදිරිපත් කර ඇති අතර ස්වදේශ කටයුතු, පලාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ PACIS පද්ධතිය යාවත්කාලීන කර ඇති බව. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (i) | සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ සෘජු අධීක්ෂණයට යටත්ව, සමාගම් පනත උල්ලංඝනය කරන සමාගම් පිළිබඳව නීතිමය කටයුතු කිරීම සහ අධිකරණ නඩු සඳහා නියෝජිතයෙකු ලෙස පෙනී සිටීම යනාදී කාර්යභාරයක් ඉටු කරන ද්විතීයික මට්ටමේ තනතුරක් වන සමාගම් පරීක්ෂක තනතුර සඳහා අනුමත තනතුරු 10 න්, තනතුරු 05 ක්ම පුරප්පාඩුව පවතින අතර, තනතුරු 02 ක් 2016 වර්ෂයේ සිට | සමාගම් පරීක්ෂක නිලධාරී තනතුර සීමිත පදනමින් බඳවා ගැනීමට අනුමැතිය ලබාගැනීමට රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීමේ අමාත්‍ය මණ්ඩල නිලධාරී කමිටුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බව. | සමාගම් පනත බලාත්මක කිරීමට අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු ඇති නොවීමට වගබලාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පුරප්පාඩුව පැවතිණි. මේ හේතුවෙන් සමාගම් පනත උල්ලංඝනය කරන සමාගම්වලට එරෙහිව නඩු පැවරීම, ආදායම් අයකරගැනීම යනාදියට අහිතකර ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය. | | |
| (ii) | දෙපාර්තමේන්තු කටයුතු e – ROC පරිගණක පද්ධතිය හරහා මාර්ගගතව සිදු කරන පසුබිමක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී අනුමත තනතුරු 03න් තනතුරු දෙකක් තනතුර අනුමත කළ දින සිටම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරෙහි අනුමත තනතුරු 06 න් තනතුරු 3ක් තනතුර අනුමත කළ දින සිටම පුරප්පාඩු වී පැවතුණි. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරුවල පුරප්පාඩු සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ විශ්‍රාමික නිලධාරින් අතරින් සුදුසු නිලධාරින් කොන්ත්‍රාත් පදනමින් නැවත සේවයේ යෙදවීමට අවශ්‍ය කටයුතු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇති අතර ජාතික අයවැය චක්‍රලේඛ 01/2024 අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය විමසා ඇති බව. | තොරතුරු තාක්ෂණ අංශයේ පුරප්පාඩු පිරවීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |